**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය - 2016**
**උපකාරක සම්මන්ත්‍රණය**

| | |
|---|---|
| **සිංහල I** | පැය තුනයි |

උපදෙස් :
- ★ පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ★ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

- පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) සැවත් නුවර සතලිස්කෙළක් විචර වස්තු ඇති සිටාණකෙනකුන්ගේ දුවණි කෙනෙක් ඇත. මනහර රූ ධරති. උන් සොළොස්හැවිරිදි වයසදී මිථ්‍යාචාරයෙන් නවතනු නිසා සත්මාල් පායේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එසේ වුවත් ඌ තුමූ තමන්ගේ ම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. උන්ගේ දෙමව්පියෝ ජාතීනුත් සම්පත්තීනුත් සම තරම් වූ සිටුපුත්‍රයාණ කෙනකුන්ට සරණ දෙන්ට නියම ව දවස් නියම කළහ. නකත්දවස් උදා වූ කලට සිටුදුවණියෝ බැඳී වසන කොල්ලාට කියන්නෝ 'මා අසවල් දවස් අසවල් සිටුපුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඩුරක් හැරගෙන ගිය නමුත් ඔබිනුත් වෙන ම රකවල් හෙයින් දක්නා පමණකටත් නොලබව. ඉදින් මා කෙරේ ප්‍රේමයෙක් ඇත්නම් ඔබ නො යන තෙක් දැන් ම මා කැඳවාගෙන කැමති තැනකට යව'යි කිවුය.

   (i) සිටුදියණියගේ ස්වරූපය මේ පාඨයෙහි ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද?
   (ii) විවාහය පිළිබඳ පැරණි සමාජයේ පැවති කෙබඳු ආකාරයේ සම්මතයක් මේ පාඨයෙන් හෙළිවේ ද?
   (iii) සිටුදියණිය තම විවාහයෙන් පසු උදා වන තත්ත්වය ආදරයෙන් බැඳුණු කොල්ලාට හෙළි කළේ කෙසේ ද?
   (iv) **'මිථ්‍යාචාරයෙන්' 'ඔබ නො යන තෙක්'** යන පදවල අර්ථ දක්වන්න. **(ලකුණු 04 යි)**

   (ආ) යට ගිය දවස හිමාල පර්වත සමීපයෙහි සදත්දහතළා නම් මහවල නිසා අට දහසක් පමණ සැදැත් කුලෙහි උපන් ඍද්ධිමත් ව ආකාශයෙන් යන ගමන් ඇති ඇත් රැළෙක් විසූහ. එකල්හි පුරන ලද පාරමිතා ඇති අප මහ බෝධිසත්ත්ව තෙම යූථපති ඇත් රජුට පුත් ව උපන්නේය. එ තෙම රිදී පර්වතයක් සේ සර්වාඞ්ගයෙන් ධවල වූය. ලාක්ෂාරසයෙන් තෙත් වූ මුඛයක් හා පාද ඇත්තේය. එතෙම මෑත භාගයෙහි වැඩිවිය පැමිණියේ අට අසූ රියන් පමණ උස ඇත්තේය. එක්සිය විසි රියන් පමණ දිගින් යුක්තය. අට පනස් රියන් දිග ඇති සොඬින් සමන්විතය. ඔහුගේ දළ වනාහි වටින් පසළොස් රියන් පමණය. දිගින් තිස් රියන් පමණය. සවනක් රැස් විහිදුවන්නේය. මේ තෙමේ අටදහසක් ඇතුන්ට නායක වූයේය. ඔවුන් පිරිවරා ගොස් පසේ බුදුවරුන් වහන්සේට පූජා කරන්නේය. මේ ඇත් රජුට චුල්ල සුභද්‍රාය, මහා සුභද්‍රාය යන ඇතිනියෝ දෙදෙනෙක් අගමෙහෙසු වූහ.

   (i) ඇත් රජුගේ පුත්‍ර බෝධිසත්ත්වයන්ගේ ශරීර ස්වභාවය මෙහි විස්තර කෙරෙන්නේ කෙසේ ද?
   (ii) නායක වූ බෝසත් ඇත් රජුගේ ආගමික ශ්‍රද්ධා භක්තිය මෙහි නිරූපණය වන්නේ කෙසේ ද?
   (iii) සැදැත් කුලයෙහි ඇතුන්ගේ විශේෂ හැකියාවක් ඉදිරිපත් කරන්න.
   (iv) '**සදත්දහතළා', 'යූථපති**' යන පදවල අර්ථ දක්වන්න.

   **(ලකුණු 04 යි)**

   (ඉ) රාජකුමාරයන් ඒ ප්‍රාසාදයෙහි වසන කල්හි දකුණු දිග ගම්වල පටන් ඒ දිශා භාගයෙහි සියලු දනවු වැසි මනුෂ්‍යයෝ ඒ දිගින් නුවරට නිමන අනෙකප්‍රකාර වූ සියලු ම අයමුඛය රාජකුමාරයන්ට ම ගෙනවුත් දෙති. එකල දවසෙක රාජකුමාරයෝ අටසිල් සමාදන් ව ඉසුරුමුණි විහාරයට ගොස් පෞසථාඞ්ගශීලය ආවර්ජනා කෙරෙමින් උන්හ. ඒ දවස් දකුණු දිශාභාගයෙහි මනුෂ්‍යයෝ සියක් ගැල් පුරා බොහෝ පඬුරු ගෙන්වාගෙන අනුරාධපුරයට යන්නාහු ඉසුරුමුණි විහාරය සමීපයට පැමිණියහ. එකල ගැල් අදනා ගොන් වියකරින් හෙළා ගැල් නො ඇද සිටියහ. මනුෂ්‍යයෝ නොයෙක් උත්සාහ කොට ගැල් පැද යා නො හී සිටියහ. ඉක්බිති එයින් එක් ගොනෙක් තමා බැඳි රැහැන් කඩාගෙන දිවන්නේ දිවියකු අතින් ගැළවී මවක කරා දිවෙන වසු පැටවකු සේ ශාලිරාජකුමාරයන් උන් විහාරයට ගොස් වන, මනුෂ්‍යයෝ ගොනුගේ පියවර සලකුණෙන් ගියාහු ශාලිරාජකුමාරයන් දැක වැඳ එකත්පස් ව සිටියහ.

   (i) ශාලිරාජ කුමාරයාගේ වාසනා සම්පත්තිය හෙළි වන එක් සිදුවීමක් මෙහි දැක්වේ. එය කුමක් ද?
   (ii) දනව්වැසි මනුෂ්‍යයන් පඬුරුවලින් ගැල් පුරවා ගෙන පිටත් වූයේ කවර ස්ථානයක් කරා යාමට ද?
   (iii) මෙහි දැක්වෙන උපමාව කුමක් ද?
   (iv) **'අයමුඛය', 'පෞසථාඞ්ගශීලය'** යන පදවල අරුත් දක්වන්න. **(ලකුණු 04 යි)**

[2වන පිටුව බලන්න.

(ඊ) තනා පබළු මුතු මිණි අබරණ පැලඳ
පිනා සඳලුවල සිටි පුරඟනෝ ළඳ
මනා ළපලු පත්මල් පල ගෙන නොමඳ
කනා ලියන් වැනි රැඳි රන්ගිරි බෙයද

පියකරු තෙනෙන් පැරඳී පිවිසි වන විල
පිවිතුරු හසුන් එන ලෙද යළි ගෙ-දිගු විල
විසිතුරු මෙපුරවර අඟනන් වෙමින් ලොල
පියයුරු පටින් බැඳ වසතියි සිතේ බල

(i) මෙපුර කාන්තාවන් සැරසී සිටියේ කෙසේ ද?
(ii) පුරඟනන් හා කනාලියන් අතර සමානත්වයක් දක්නට ලැබෙන්නේ කෙසේ දැයි දක්වන්න.
(iii) ගෙදිගු විල හංසයන් වනවිල් කරා ඇදී ගියේ ඇයි?
(iv) **"පියයුරු පටින් බැඳ වසතියි සිතේ"** යන යෙදුමෙහි කාව්‍යාලංකාරය දක්වන්න.

**(ලකුණු 04 යි)**

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "තොප කළ සේ නො යෙදෙයි. මිත්‍රද්‍රෝහ නම් යහපත් දෙයක් නො වෙයි."
(ii) "තොපගේ අදහස විශාරද නියාව ආදී නො හැඟුණත් දැනුත් නො හැඟේ ද?
(iii) "මේ කැඳින් මඳක් අනුභව කළ ඇසිල්ලෙහි ගොළුවෝ කථා කෙරෙති"
(iv) "මොනවලු! එහෙනම් ගෙදර උදවිය මේ විත්තිය දන්නව"
(v) "මේක නැති වුණ දාට මමත් ඉවරයි කියල හිතාගන්න."
(vi) "වරද්දල තේරුම් ගන්ඩ එපා. අද මගෙ ඔළුව කකියනව."

**(ලකුණු 08 යි)**

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පරපුරක කළු දුඹුල් කඩා පිරිසිදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝද සෝදා හරින
අලුත් වැස්සක අසිරි පතා සිටියෙන් නිතින
මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින

දැදුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
සුව සිසිල නිදහසේ උරා බී සැප විඳින
ලෝකයේ පුස්ඹ පිරිතිරෙන ලෙස විවර වුණ
වලව්වට සිව් දිගින් සුළං රැලි විත් නටන

අලුත් වැස්සෙන් පෙඟුණු පින්තූරයෙන් එබෙන
රත් යවට සේ දැවෙන තාත්තගෙ නෙත්වලින
දීප්තිය නිවී සේදී දුකට කඳුළු එන
රාමුවෙන් බිඳෙන් බිඳ පතිත වී ලිහී යන

ඇතුළු ගැබ නො දුටු අහුමුලු සොයා හඹා යන
අලුත් වැහි හැළිවළං උතුරුවා ඇද වැටෙන
මහ පෙට්ටගම හායි ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන

බමුණු මහසල් කුලයෙ රස්නයෙන් ඉරි පැලුන
මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන
ලොවට දුන් ගිනි ම යළි ගෙ බිම ගිනියම් කරන
අලුත් වැස්සෙන් එ ගිනි නිවී නිවී සංසිඳෙන

එදා දස දිගින් වැඩි සුළඟට ද වැසු දොරින
ඇතුළු වෙයි ගැමි දනන්ගේ වේදනා මුහුණ
වලව්වේ විය ගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන

**(ලකුණු 16 යි)**

2. විවිධ පුද්ගල චර්යා නිරූපණයේ දී සද්ධර්මරත්නාවලි කතුවරයා දැක්වූ කුසලතාව කෙබඳු වී දැයි නියමිත කතාවස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

**නැතහොත්**

"ජාතක කතා කතුවරයාගේ නිර්මාණ ශක්තිය හෙළි වන වැදගත් අංශයක් වනුයේ පරිසර වර්ණනායි" නියමිත කතාවස්තු **දෙකක්** ඇසුරෙන් විමර්ශනය කරන්න. (ලකුණු 15 යි)

3. වරදට පෙලඹීමත්, වැරදිවලට සමාව දීමත් සමාජයේ නිතර දක්නට ලැබෙන ලක්ෂණයකි. මේ මනුෂ්‍ය ස්වභාවය නිරූපණය සඳහා සද්ධර්මාලංකාර කතුවරයා කොතෙක් දුරට සමත් වන්නේ දැයි නියමිත කතා වස්තු ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

4. තම අදහස් තහවුරු කිරීම සඳහා බෞද්ධ හා හින්දු සාහිත්‍යාගත තොරතුරු ඉදිරිපත් කිරීමට ගිරා සන්දේශ කතුවරයා දැරූ උත්සාහය කෙතෙක් දුරට සාර්ථක වී ඇත් දැයි අභිමත නිදසුන් **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

5. "මළගිය ඇත්තෝ නවකතාවෙන් නිරූපණය වන්නේ විවිධ බාධක හා දුෂ්කරතා ජය ගැනීමට නො හැකි ව අපේක්ෂා භංගත්වයට පත්වන පුද්ගලයන්ගේ චරිත ස්වභාවයයි." විමර්ශනය කරන්න. (ලකුණු 15 යි)

6. පාඨක සිත්හි සංවේදිතාව දනවන ආකාරයෙන් පියපුතු සෙනෙහසේ ස්ථාවරත්වය ඉදිරිපත් කිරීමට "තාත්තා" කෙටිකතාකරු දක්වන කුසලතාව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 15 යි)

7. කාව්‍ය නිර්මාණයේ දී සංකල්ප රූප භාවිතය මගින් තම අදහස් විචිත්‍රවත් කිරීමට නූතන කවීන් දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට පද්‍ය පන්ති **තුනක්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

8. රත්නාවලි නාට්‍යයේ කථාවස්තු විකාශනයේ දී විදූෂකගේ චරිතයෙන් ලැබෙන ආලෝකය කෙබඳු දැ'යි විග්‍රහ කරන්න. (ලකුණු 15 යි)

The National e-learning Portal for The General Education

* * *

| | |
|---|---|
| **අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය - 2016**<br>**උපකාරක සම්මන්ත්‍රණය** | |
| **සිංහල II** | පැය තුනයි |

උපදෙස් :

- ★ I කොටසේ I ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ★ I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- ★ I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 **ඝෝෂ අල්පප්‍රාණාක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ට, ප, ච, ක, ත (2) ග, ස, ම, ථ, ඩ
(3) ධ, ණ, ය, ර, ව (4) ඡ, ද, බ, ග, ඩ
(5) ය, ච, ප, ස, බ (.............)

1.2 **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) ප්‍රස්ථාවනා, අමාත්‍යාංශය, වාර්ථාව, ශ්‍රැති ගෝචර, නීත්‍යානුකූල
(2) ව්‍යංගයාර්ථ, උද්ධමනය, මිථ්‍යාදෘෂ්ටි, කුෂ්ඨරෝගී, සාමර්ථ්‍යය
(3) ලේඛනය, උත්තරධ්‍රැව, අධ්‍යාත්මික, පීතෘ ස්නේහය, ප්‍රසාරනය
(4) නෂ්ඨප්‍රාප්ත, අෂ්ට ලෝක ධර්මය, සංක්‍රමණය, කෘතිම, සනාථන සභාව
(5) ස්වභාවික, සෞන්දර්යය, වර්ධන, මර්දනය, සංවත්සරික (.............)

1.3 **අකාරාදි පිළිවෙළ** අනුව **නිවැරදි** ව **ලියා** ඇති පද පේළිය තෝරන්න.
(1) ප්‍රගතිය, ප්‍රවර්ධනය, ප්‍රහර්ෂය, ප්‍රේක්ෂක, ප්‍රේමාන්විත
(2) අධ්‍යක්ෂ, අත්තනෝමතික, ඇස්තමේන්තු, අස්ථාවර, අස්ථිපඤ්ජර
(3) ඊශ්වර, ඊර්යාපථ, ඉන්ද්‍රියගෝචර, උත්තීර්ණ, උපභාෂණ
(4) වෛරාග්‍ය, වෛවර්ණ, වෛචිත්‍රය, වෛශ්‍රවණ, වෛදූර්ය
(5) කදාවළලු, කදෝපැණි, කාමාසක්ත, කච්ඡපුට, කර්ණගෝචර (.............)

1.4 පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) ප්‍රත්‍යයාර්ථ නාමවලට තද්ධිත පද පමණක් ඇතුළත් වේ.
(2) සම්බන්ධ විභක්තිය කාරකයක් ද වේ.
(3) වර්ණ ආදේශ වීමේ දී ලෝපයක් සිදු නො වේ.
(4) උක්ත මෙන් ම අනුක්ත නාම පද සමග ද "මෙන්" නිපාතය යෙදේ.
(5) ශුද්ධ ආඛ්‍යාත පද ලිංග අනුව වර නො නැගේ. (.............)

1.5 **ගැටය සහිත ඇලපිල්ල, ගැට දෙක සහිත ඇලපිල්ල, රේඵය, රකාරාංශය සහිත** ඇදය යන සංකේත **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) දෘශ්‍යගෝචර, කර්තෘන්, මහාචාර්ය, බහුශ්‍රැත (2) කෘතහස්ත, බෲනෙයි, නිරුපද්‍රැත, කාර්යාලය
(3) තෘප්තිය, ශාස්තෲන්, ද්‍රැම, මාත්සර්යය (4) වක්තෘ, පුනරාවර්තන, මාතෲන්, ශ්‍රැතිය
(5) ගෘහෝද්‍යානය, දුහිතෲන්, ධ්‍රැවය, නර්තනය (.............)

1.6 එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) ආචාර ධර්ම, ආපණ ශාලා, ඇදුරු පරම්පරාව, අඝෝෂ අක්ෂර
(2) අණ පනත්, ඉටු අනිටු, කුල සිරිත්, වැලි කතර
(3) ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා, කනිෂ්ඨ පුත්‍ර, ශබ්ද කෝෂය, වදන් මාලාව
(4) මහිලා සමිති, සමුද්‍ර තරංග, තිමිර පටල, දුර්ග මග
(5) නීති සංග්‍රහය, ජ්‍යෝතිර් විද්‍යාව, වංක පිළිවෙත්, ශාස්ත්‍ර ඉගෙනීම (.............)

[2වන පිටුව බලන්න.

1.7 **තත්සම වචන පමණක් යෙදී ඇති වරණය කුමක් ද?**
(1) සත්‍ය, මිථ්‍යා, කෘත්‍ය, තථ්‍ය
(2) ප්‍රාථමික, සොඳුරු, මින්දද, භෘංග
(3) ක්ෂිතිජය, ලක්ෂණ, වක්‍ර, සුරත්
(4) දෛවඥ, පුරඳුරු, මියුලැසි, මන්දිර
(5) ආගන්තුක, ජලනිධි, මිහිතල, අගාධ (..............)

1.8 මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) විරුද්ධ - මිත්‍ර, පක්ෂපාතී, අනුකූල, ඉෂ්ට
(2) ප්‍රීතිය - දුක, ඛේදය, දොම්නස, සන්තාපය
(3) අවමාන - කීර්තිය, ප්‍රශංසා, යසස්, සම්මාන
(4) ප්‍රමුඛ - අප්‍රධාන, ද්විතීයක, අවශේෂ, මුඛ්‍ය
(5) අවංක - කුටිල, වක්, කපටි, වංචනික (..............)

1.9 මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
(1) පිපුණු - මිණිමුතු, විකසිත, පුල්, පිබිදුණු
(2) ලෝකය - දිය, ජගත්, විශ්වය, දියත
(3) ආශ්චර්යය - විස්මය, පුදුමය, මවිතය, අද්භූත
(4) මෝඩ - බුද්ධිහීන, මූඪ, මුග්ධ, දද
(5) ප්‍රසිද්ධ - පුවතර, ප්‍රකට, ව්‍යාප්ත, පවර (..............)

1.10 **අව්‍යය, අන්‍යාර්ථ, විභක්ති, විශේෂණ** යන සමාසවලට අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) දසපනත, කුකවි, දිනකර, සොරබිය
(2) රන්කම්, නෙත්බිඟු, මලවි, දුශ්ශීල
(3) අවමන්, සුරමග, මල්පැණි, තෙරුවන්
(4) අභිධර්ම, මිහිදුම්, නැගෙනහිර, රතුකැකුළ
(5) නොදරුවා, කහකුරුලු, වනමල්, හිරවරණ (..............)

1.11 **කෘදන්තයක් නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) හදාළ, වපුළ, මළ, පුවළ
(2) බැලිලි, නැටිලි, කැපිලි, සෙව්ලි
(3) තෙමන, පිසින, වයන, මවන
(4) රැඳි, බැඳි, සැදි, විඳි
(5) සනසනු, නළවනු, කියවනු, වළකනු (..............)

1.12 පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
* ගැමිලිය රටා **දමා** පැදුර වියුවා ය.
* නිළිය නැටුමක් **නටන්නට** වේදිකාවට ආවා ය.
* වැසි **වැස්සොත්** උණුසුම පහව යනු ඇත.
* ශිෂ්‍යයන් විසින් විභාග ජය **ගැනෙයි.**
(1) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, අපරක්‍රියා, කර්මකාරකක්‍රියා
(2) අපරක්‍රියා, පූර්වක්‍රියා, කර්මකාරකක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) කර්මකාරකක්‍රියා, අපරක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(4) අපරක්‍රියා, කර්මකාරකක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා
(5) පූර්වක්‍රියා, අපරක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, කර්මකාරකක්‍රියා, (..............)

1.13 **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) දෙවියන්, කුහුඹුවකු, ඕතොමෝ, හෙතෙම
(2) පැටවෙක්, පුෂ්පයන්, බුද්ධිමතකු, අප
(3) කවුරු, අයෙක්, තොටියන්, ලියක්
(4) බමරුන්, කොවුලන්, තුරුහු, ගැහැනියක
(5) මිතුරුතුමෝ, රජහු, නිවැසියන්, පළගැටියෝ (..............)

1.14 **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) අවලස්සන, අවපීඩන, අවකම්පන, අවමාන
(2) දුර්ජන, දුර්මත, දුර්නීති, දුර්විපාක
(3) අබිසෙස්, අබිමන්, අබිමුව, අබිදහම්
(4) විශිෂ්ට, විදේශ, විමධ්‍යගත, විමාන
(5) පිරිසුදු, පිරිපුන්, පිරිනිවන, පිරිසිඳ (.............)

1.15 **ගනඳුර** වසන විට **ආලෝකයෙහි** නෙත
**සඳරැස්** ගලන විට **තෙරපී** සෙවණ මත
මෙම පද්‍ය පාදවල **තද කළු අකුරින් මුද්‍රිත පදවල** ව්‍යාකරණ අංග පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?
(1) සන්ධි, විභක්ති, ක්‍රියා, සමාස
(2) සමාස, විභක්ති, සන්ධි, ක්‍රියා
(3) සන්ධි, විභක්ති, සමාස, ක්‍රියා
(4) සමාස, ක්‍රියා, සන්ධි, විභක්ති
(5) සන්ධි, සමාස, විභක්ති, ක්‍රියා (.............)

1.16 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) පුනරුක්ති, පුනරාගමනය, පුනරීක්ෂණය, පුනරුදය
(2) අඳනා, රඳනා, බඳනා, පවනා
(3) කියත, දමත, බඳිත, අඳිත
(4) නුවනත්, සවනත්, කොපුලත්, ගහණත්
(5) අතුර, මතුර, වපුර, විසුර (.............)

1.17 **සමාසයක් නො වන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අනාදර, අව්‍යක්ත, අනවශ්‍ය, අශික්ෂිත
(2) මුහුදුදිය, ගම්වැසි, සරාසඳ, තැඹිලිතෙල්
(3) දසබල, විදුරත්, තිනෙත්, සහස්පත
(4) දුහුල්සළු, රතුපුල්, නිල්අහස, පිරිපත
(5) දෙව්බඹ, වතුපිටි, ගුරුසිසු, අඹදඹ (.............)

1.18 **එක ම වර්ගයකට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) කම්මුල, පෙස්සම, ගෙත්තම්, අල්ලස්
(2) දැස, වීරෝදාර, එකිනෙක, සූර්යෝදය
(3) නළඟන, තරිඳු, නුවනග, දිනිඳු
(4) මංපෙත්, ගම්පොළ, මිහින්තල, තඹුරු
(5) අත්‍යලංකාර, අන්වර්ථ, අභ්‍යුදය, නීත්‍යනුකූල (.............)

1.19 **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) මම දක්ෂ නාට්‍ය නිෂ්පාදකයකු වෙමි.
(2) තාපසවරුන් වනයේ පලාපල අනුභව කරත්ලු
(3) ගුරුතුමා තම ශිෂ්‍යයන් යහමග යවති.
(4) තම ඥාති මිත්‍රාදීන් සමග මනාලිය විවාහ මංගලෝත්සවයට පැමිණියා ය.
(5) සෝමා දක්ෂ ගායිකාවක් ද නිළියක ද වන්නීය. (.............)

1.20 **වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය** තෝරන්න.
(1) මුළු පවුල ම ලබන සතියේ විදේශගත වන බව ඇය පැවසුවා ය.
(2) තාක්ෂණය මානවසංහතියේ ප්‍රගමනය සඳහා යොදාගැනීම වැදගත් ය.
(3) තුන්වන ලෝකයේ රට වල දරිද්‍රතාව තුරන් කරදීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රයත්නයයි.
(4) සිංහල කෙටිකතාවේ වර්ධනය උදෙසා බටහිර කෙටිකතාවේ ආභාසය ලැබුණුබව විචාරකයින් ගේ මතයයි.
(5) ලාංකික දූ දරුවන් ගේ වග කීම වන්නේ නිදහස් අධ්‍යාපනයේ නිසිපල ලබාගැනීමයි.
(.............)

**(ලකුණු 20 යි)**

[4වන පිටුව බලන්න.

## II කොටස

* **මෙම කොටසේ 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

2. (අ) පහත සඳහන් පාඨය කියවා **අසා ඇති** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නැනෝතාක්ෂණය යනු නිෂ්පාදිතවල පවතින මුහුණුවර වෙනස් කර නව ලක්ෂණවලින් යුත් සුවිශේෂී භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාවක් ඇති අභිනව සොයා ගැනීමකි. පරමාණු වැනි ඉතා සියුම් මට්ටමක දී ද්‍රව්‍යවල අන්තර්ගතය වෙනස් කිරීමෙන් එහි ආවේණික ගති ලක්ෂණ වෙනස් කිරීම මේ හා සම්බන්ධ වේ. ඒ අනුව, නැනෝතාක්ෂණය යොදා ගන්නා අවස්ථා බොහොමයක් කර්මාන්ත අංශයේ විවිධ ක්ෂේත්‍රවල දැකිය හැකි ය. අද බොහෝ රටවල් කර්මාන්ත අංශය වැඩිදියුණු කිරීම සඳහා නවීන පන්නයේ නිෂ්පාදිත අඩු පිරිවැයකින් නිපදවීමට නැනෝතාක්ෂණය භාවිත කරයි. උදාහරණයක් ලෙස සාමාන්‍ය රෙදිපිළි, නැනෝතාක්ෂණය යොදා ගනිමින් දියර සහ වෙනත් ද්‍රව්‍ය උරා නො ගන්නා රෙදිපිළි බවට සකස් කිරීමට හැකි වන අතර, මේ නිසා පැල්ලම් සහ ඉහිරීම්වලින් බලපෑමක් නොවන විශේෂ ගුණයක් මෙම රෙදිපිළිවලට ලැබේ. එමෙන් ම, නෙළුම් මලේ දැකිය හැකි ජලය නො රැඳෙන විශේෂ ගුණාංගය, නැනෝතාක්ෂණය යොදා ගනිමින් තීන්තවල ඇති කිරීමෙන් තීන්ත ආලේප කරන බිත්ති දූවිලි සහ ජලය එකතු නොවී දිගුකලක් මුළුල්ලේ පිරිසිදු ව තබා ගැනීමට හැකි වී තිබේ. තව ද ඉතා උස ගොඩනැගිලිවල වීදුරු ජනේල පිරිසිදු කිරීමේ අපහසුතාවට විසඳුමක් වශයෙන් නැනෝතාක්ෂණය භාවිත කොට දූවිලි සහ වෙනත් සියුම් අපද්‍රව්‍ය නො රැඳී ඉබේ ම පිරිසිදු වන වීදුරු වර්ග යක් නිෂ්පාදනය කර ඇත. මේවා කර්මාන්ත අංශය නැනෝතාක්ෂණය යොදා ගන්නා ආකාරය සඳහා ඇති උදාහරණ කිහිපයක් පමණි.

(i) නිෂ්පාදිතවල පවත්නා මුහුණුවර වෙනස් කිරීම සඳහා නැනෝතාක්ෂණයේ ඇති හැකියාව හෙළි කරන නිදසුන කුමක් ද?

(ii) නැණෝතාක්ෂණය යොදා ගන්නා අවස්ථා බෙහෙවින් දක්නට ලැබෙන්නේ කවර අංශයක ද?

(iii) නවීන පන්නයේ නිෂ්පාදන අඩු පිරිවැයකින් නිපදවීමට නැනෝතාක්ෂණය යොදා ගැනීමට අදාළ නිදසුන කුමක් ද?

(iv) බිත්ති පිරිසිදුව තබා ගැනීමටත් වීදුරුවල දූවිලි සහ වෙනත් අපද්‍රව්‍ය නො රැඳීමටත් නැනෝතාක්ෂණය මගින් යෙදූ ප්‍රතිකර්ම මොනවා ද?

(v) නැනෝතාක්ෂණය උපයෝගී කොට ගත හැකි අවස්ථා කීයක් මෙහි දැක්වේ ද?

**(ලකුණු 10 යි)**

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, එහි වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

රටෙහි භූගෝලීය පිහිටීම, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ නවීකරණය කිරීම සහ දෙවන අන්තර් ජාතික ගුවන් තොටුපොළ ඉදිකිරීමත් සමග ගුවන් කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයක් බලාපොරොත්තු විය හැකි අතර, ඉහළ තරගකාරිත්වයක් සහිත කලාපීය ගුවන් කේන්ද්‍රස්ථානයක් ලෙස ඉස්මතු වීමටත් විභවතාවක් පවතී. කලාපීය ගුවන් කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීමත් සමග සංචාරක කටයුතු සම්බන්ධයෙන් පවතින විභවතාව උපයෝජනය කිරීමට හැකියාවක් පවතින අතර, රටවල් 60කට වඩා වැඩි ප්‍රමාණයක් සමග ද්විපාර්ශ්වීය ගුවන් සේවා පැවතීම, ගොඩබිම් හා ජලාශ්‍රිත ව ගුවන් යානා නැවැත්විය හැකි ස්ථාන පැවතීම සහ විනෝදාත්මක ගුවන් පහසුකම් සැපයීමට ඇති හැකියාව සංචාරක ගුවන් සේවා සැපයීමට අවශ්‍ය පහසුකම් සලසනු ඇත.

කෙසේ නමුත්, ගුවන් කර්මාන්තයේ කාර්යක්ෂමතාව සහ ඉහළ වර්ධනයට ඉවහල් වන තරගකාරී ව්‍යාපාරික පරිසරයක් සැකසීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රජයේ ආයතන සහ කර්මාන්තයේ නියැලෙන අනෙකුත් පාර්ශ්වයන් අතර, සහයෝගිතාව ඇති කිරීම වැදගත් වේ. සිවිල් ගුවන් කර්මාන්තය සඳහා වෙන් වූ මානව සම්පත් පදනමක් ගොඩ නැගීම සඳහා අවශ්‍ය වන විශේෂිත දැනුම සෑම අධ්‍යාපන මට්ටමකටම ලබා දීම සඳහා විශේෂිත පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම තුළින් ගුවන් කර්මාන්තයේ පවතින මානව සම්පත හා සම්බන්ධ ගැටලුවලට පිළියම් යෙදිය යුතු වේ.

**(ලකුණු 15 යි)**

[5වන පිටුව බලන්න.

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.
   - (i) ශාරීරික හා මානසික සෞඛ්‍යය උදෙසා ක්‍රීඩාවෙන් ලැබෙන පිටිවහල
   - (ii) අපථ්‍ය ආහාර වෙනුවට වස විස නැති ආහාර හඳුන්වා දීමෙන් ජනතාවට අත්වන ප්‍රතිලාභ
   - (iii) මුහුණු පොත (Face Book) වෙබ් අඩවියට ඇබ්බැහි වීම නිසා නොමග යන තරුණ පරපුර
   - (iv) හිංසනයට හා අපචාරයට ගොදුරු වන දරුවන් හා කාන්තාවන් සුරැකීම ජාතික මෙහෙවරකි.
   - (v) සමාජයේ දරිද්‍රතාව පිටු දැකීම සඳහා ප්‍රතිලාභ ප්‍රදානයට වඩා ධනෝපායන මාර්ග හඳුන්වා දීමේ වැදගත්කම
   - (vi) මිනිසුන් අතර පවත්නා අතෘප්තිකර ආශාව හා තරගකාරී හැඟීම් සමාජ අරගල සඳහා හේතු වේ.

**(ලකුණු 25 යි)**

4. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන්** ඇතොත් **නිදොස්** කොට ලියන්න.
   - (i) චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට රසිකයෝ පැමිණෙති'යි මම සිතීමි.
   - (ii) ආපදාවෙන් විපතට පත් වූවෝ බේරා ගැනීමට කිසිවකු ඉදිරිපත් වී නැත.
   - (iii) සාමය උදෙසා ලෝක බලවත්තු එකාවන්ව නැගී සිටිත්.
   - (iv) අමාත්‍ය මණ්ඩලයේ කෙනෙක් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහ.
   - (v) නීතිඥයන් නිවැරදිකරුවෝ මුදා හැර වැරදිකරුවන් නීතියේ රැහැනට කොටු කරගත යුතු ය.

**(ලකුණු 05 යි)**

(ආ) පහත සඳහන් වාක්‍යය **කර්මකාරකයට** හරවන්න.
   - (i) උසස් අධ්‍යාපන ආයතන නව වසර සඳහා සිසුන් බඳවා ගනියි.
   - (ii) දෙමවුපියෝ ගුරුවරුන් සඳහා උපහාර උලෙළක් සංවිධානය කරවන්නෝ ය.
   - (iii) දේශප්‍රේමීහු ස්වාර්ථය පතා රටෙහි නීතීන් උල්ලංඝනය නො කරත්.
   - (iv) රියැදුරෙක් මහ මග වැටී සිටි ගැබිනියක රෝහල් ගත කළේ ය.
   - (v) රටෙහි ජනතාව රකින්නෝ රණවිරුවෝ ය.

**(ලකුණු 05 යි)**

(ඉ) **නිවැරදි** වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා **සුදුසු පදය** වරහන් තුළින් තෝරා ලියන්න.
   - (i) පුවත්පත් (කලාවේදීහු/කලාවේදීන්) පැමිණිය හොත් අපි සාකච්ඡාව ආරම්භ කරමු.
   - (ii) විදග්ධ කිවියෝ ආධුනික (කිවිඳියන්/කිවිඳියෝ) කැටුව කවි සම්මේලනයට සහභාගි වූහ.
   - (iii) මග දෙපස වූ නත් පැහැගත් (ප්‍රදීපයෝ/ප්‍රදීපයන්) නගරය අලංකාර කළහ.
   - (iv) සභාතොමෝ නව ව්‍යවස්ථාව ඒකච්ඡන්දයෙන් සම්මත (කළාය/කළහ)
   - (v) මෙම වසරේ ජනප්‍රිය ගායකයා (කවරෙක්/කවරෙකු) ද?

**(ලකුණු 05 යි)**

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරින්** දක්වා ඇති පදවල අර්ථ **විග්‍රහ** කර දක්වන්න.
   - (i) ඇතැමුන්ගේ **පරවම්භනාත්මක** ආකල්ප නිසා සමාජයේ ගැටුම් ඇති වේ.
   - (ii) පාබල හමුදාභටයා ද්වන්ද්ව යුද්ධයේ දී **අනභිභවනීය** ලෙස සටන් කළේ ය.
   - (iii) කාව්‍ය සම්පත්තිය ළඟා කර ගැනීමට හේතුවන එක් උපායමාර්ගයක් වනුයේ **සතතාභ්‍යාසයයි.**

**(ලකුණු 03 යි)**

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.
   - (i) ගුවනෙහි සැරිසරන්නා
   - (ii) තමා සතු සම්පත් සඟවා තබා ගැනීමේ ආශාව
   - (iii) තමන් පමණක් ජය ගැනීමේ ආශාව

**(ලකුණු 03 යි)**

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.
   - (i) අවට ගස් මුදුන්වලින් ඇද හැලුණු මල් රේණුයෙන් වැලි තලාව ........................... විය.
   - (ii) ....................... මනසක් ඇති ඔහු මෙවරත් විභාගයෙන් අසමත් විය.
   - (iii) අවුරුදු උත්සව ............................ සහභාගි වූ මගේ නංගි තෑගි කිහිපයක් ම දිනා ගත්තා ය.
   - (iv) මුහුදු දිය .......................... හසු වූ මගේ දෙපා තෙමී ගියේ ය.
   - (v) පති ............. ධර්මය කාන්තාවකට ආභරණයක් සේ සැලකේ.
   - (vi) සං ...........................ස්වර උච්චාරණයේ දී මුඛ කුහරයෙන් මහ හඬක් නො නැගේ.

   (ව්‍යාකූල, ආකූල, තරඟාවලියට, තරඟාවලියට, වෘත, ව්‍රත)

**(ලකුණු 03 යි)**

[6වන පිටුව බලන්න.

(ඊ) තද කළු අකුරින් දක්වා ඇති බහු අර්ථ පද යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.

(i) දඩයක්කරුගේ වෙඩි හඬට බිය වූ **මුව** රැළ ඔබ මොබ පැන දිවූහ.

(ii) **තුරු** හිස් මතින් පැන යන වඳුරන් නිසා වන රොද අලංකාරවත් විය.

(iii) කුඩා දරුවා පියාගේ **කර** මත නැගී පෙරහැර නැරඹුවේ ය.

(iv) **බල** තණ්හාව නිසා ලෝකයේ බොහෝ රටවල යුද ගිනි ඇවිළී ඇත.

(v) පුද්ගලයන් **වදදීම්**වලට ලක් කිරීම යෝග්‍ය වූවක් නො වේ.

(vi) සමුද්‍රාසන්න ප්‍රදේශවල ලෝහ ද්‍රව්‍යවලට **මල** බැඳීමේ වැඩි ප්‍රවණතාවක් පවතී.

(ලකුණු 06 යි)

6. තද කළු අකුරෙන් දී ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට හා අනු අංගයකට අයත් දැයි දක්වන්න.

(i) **ශිෂ්‍යයන්** ක්‍රීඩා පිටියට **පිවිසෙද්දී තදින්** වහින්නට විය.

(ii) දහවල් **දොළහෙන්** පසු **භෝජනාගාරය මිනිසුන්ගෙන්** පිරී ගියේ ය.

(iii) ගසක් මුලට **වී** විඩාව **සංසිඳුවා** ගත් මගියා **යළිත්** ගමනාරම්භ කළේ ය.

(iv) මලල ක්‍රීඩාවේ දී **රන්පදක්කම** දිනූ මගේ මිත්‍රයා මහමගට පිවිසි **උන්මත්තකයෙකු මෙන්** දුවන්නට විය.

(v) **අගරු** චෙක්පත් **නිෂ්කාශනය** කරන්නැයි **බැංකුකළමනාකරු** සේවකයන්ට පැවසී ය.

(ලකුණු 15 යි)

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) ධන හීනයකුට හදිසියෙන් ලැබෙන ලාභය

(ii) සුළු ලාභයක් නිසා වැඩි අලාභයක් නොසලකා යමක් කිරීම

(iii) උත්සාහය ඇත්නම් ජය ලබාගත හැකි ය

(iv) කෙනෙකුගේ අය මාර්ග සම්පූර්ණයෙන් ම වසා ගැනීම

(v) අයහපත් කාලයෙහි ස්වකීය ඥාතීන්ගෙන් වෙන් ව වාසය කිරීම

(vi) උවමනාවට වඩා උඩඟු වීම (ලකුණු 03 යි)

(ආ) පහත දී ඇති රූඪීවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

(i) තොරතෝංචියක් නැති
(ii) උරවක්‍රමාලය
(iii) දෙහි කපනවා
(iv) මූණෙ දැලිගානවා
(v) හිල් කුඩෙන් වතුර ඇදීම
(vi) පලිප්පු දමනවා (ලකුණු 03 යි)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පදය සෑදී ඇති රටාව කුමක් ද'යි දක්වන්න.

(i) ආචාර සමාචාර
(ii) අතන මෙතන
(iii) අනම් මනම්
(iv) ඉඩම් කඩම්
(v) බත් බුලත්
(vi) මැහුම් ගෙතුම් (ලකුණු 03 යි)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(i) කණිසම
(ii) කුණ්ඩ හට්ටිය
(iii) සුනංගු
(iv) බුන්නා
(v) බුඩා
(vi) කුයිල (ලකුණු 03 යි)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

(i) කලවිට
(ii) උප්පිඩි
(iii) පන්නෙ ගහනවා
(iv) වළාලය
(v) කෝඩු කරනවා
(vi) බෝල් අත්ත (ලකුණු 03 යි)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බටහිරඉන්දියාවෙන්ලංකාවටසංක්‍රමණයවූආර්යයන්රටතුළටගමන්කොටඇත්තේත්වාසයටතෝරාගෙනඇත්තේත්ගංගාආශ්‍රිතප්‍රදේශබවපැහැදිලිකරඇතමේබවමහාවංශයේඑනතොරතුරුවලටඅමතරවශිලාලේඛනසෙල්ලිපිලැබීඇතිස්ථානපරීක්ෂාවෙන්දනිගමනයකළහැකියමුලින්තම්බපණ්ණිනගරයදදෙවනුවඋපතිස්සනගරයදඅනුරාධපුරයදදියුණුනගරබවටපත්වියතම්බපණ්ණිනගරයමල්වතුඔයආශ්‍රිතවදඑහිශාඛාවක්වූකණදරාඔයඅසබඩඋපතිස්සග්‍රාමයදපිහිටාතිබේකලාඔයේමෝයඅසලඋරුවෙලානගරයපිහිටාඇතඋදේනිගමකුමනස්ථානයකපිහිටාතිබෙන්නටඇත්දැයිදැනටඇතිසාධකමගින්තහවුරුකරගතනොහැකිවීඇතත්එයගංගාවක්ආශ්‍රිතවපිහිටන්නටඇතැයිසිතියහැකියදැනටලැබීඇතිසෙල්ලිපිවැඩිප්‍රමාණයක්මල්වතුඔයකලාඔයදැදුරුඔයහාමහඔයයනප්‍රදේශවලින්ලැබීඇතිබැවින්මේප්‍රදේශවලමුල්ආර්යයන්ජනපදපිහිටුවාගන්නටඇතැයියන්නස්ථිරවේමුල්ආර්යයන්රටඇතුළටගමන්කරඇත්තේමේඔයවල්දිගේයැයිපැහැදිලිවේ

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.
(ii) ඌෂ්මාක්ෂරයක් සහ මූර්ධජ අක්ෂරයක් සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න.
(iii) ඡේදයේ ඇති "තොරතුරු" යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.
(iv) රකාරාංශය හා ඉස්පිල්ල එකට යෙදී ඇති පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.
(v) බැඳි අකුරක් හා රේඵයක් යන දෙක ම අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.

**(ලකුණු 15 යි)**

* * *

The National e-learning Portal for The General Education